**බේරුවල නගර සභාව**

**කළුතර දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූලි 22 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට බේරුවල නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු ව්‍යාපාර බදු රු.102,000 ක මුදල මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුවත්, එසේ නොකර, වෙනත් ආදායම්වලින් අඩුකර දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල ප්‍රාග්ධන ආධාර මුදල රු.4,418,657 ක් වුවත් එය මූල්‍ය ප්‍රකාශනවල රු.1,888,588 ක් වශයෙන් දක්වා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ආධාර මුදල රු.2,530,069 ක් අඩුවෙන් ගිණුම්වල දක්වා තිබුණු අතර කර්මාන්ත ණයගැති වටිනාකම රු.2,530,069 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල මූලධන වියදම රු.9,337,232 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල එය රු.11,241,897 ක් වශයෙන් දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූලධන වියදම රු.1,904,665 ක් වැඩියෙන් දක්වා තිබුණි.

තවද 2015 දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණයහිමි ශේෂය රු.2,531,069 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල රු.4,435,731 ක් වශයෙන් දක්වා තිබීම හේතුවෙන් කර්මාන්ත ණයහිමි ශේෂය රු.1,904,662 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයන්ට අදාලව සමාලෝචිත වර්ෂයේදී ලැබුණු මුද්දර ගාස්තු රු.2,758,070 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම ලෙස ගිණුම් ගත කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයට අදාල මුද්දර ගාස්තු ආදායම ගණනය කර ගිණුම් ගත කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගනු ලැබූ රු.55,519 ක් වූ කාර්යාල උපකරණ සහ රු.26,668 ක් වූ යන්ත්‍රෝපකරණ, ප්‍රාග්ධන වැය යටතේ නොදක්වා පුනරාවර්තන වියදම් යටතේ දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයට අදාලව ස්ථාවර තැන්පත් මුදල රු.13,424,764 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල රු.13,446,509 ක් වශයෙන් දක්වා තිබීම හේතුවෙන් ස්ථාවර තැන්පත් ශේෂය රු.21,745 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයට අදාලව ස්ථාවර තැන්පත් පොලිය රු.496,242 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල රු.480,624 ක් ලෙස දැක්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පත් පොලිය රු.15,618 ක් අඩුවෙන් දක්වා තිබුණි.

### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 10 ක ගිණුම් අනුව ශේෂය රු.65,367,764 ක් හා උපලේඛන අනුව ශේෂය රු.66,873,877 ක් වූයෙන් රු.1,506,113 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

එකතුව රු.4,767,568 ක් වූ ගිණුම් ශේෂ 6 ක් විස්තරාත්මක උපලේඛන හා විස්තර ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

### **1.3.4 නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම්**

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 371(අ) ප්‍රකාරව කිසියම් කාර්යයක් සඳහා දෙනු ලබන අත්තිකාරම් මුදලක් එම කාර්යය නිම වූ වහාම පිය විය යුතු වුවද 2015 දෙසැම්බර් 11 වන විට 2008 වර්ෂයේ සිට පැවත එන නොපියවූ අත්තිකාරම් ශේෂය රු.252,285 ක් විය.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදයම රු.28,402,723 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදයම රු.20,858,335 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.24,596,759 ක් වූ හිඟ ආදායම් නගර සභා ආඥා පනතේ (255) අධිකාරියේ 160, 165, 170 වගන්තිවල විධිවිධාන අනුව අයකර ගෙන නොතිබුණි.

2.2.2 **වරිපනම් බදු**

(අ) 2015 ජනවාරි 01 දිනට රු.19,317,599 ක් වූ හිඟ හිටි වරිපනම් බදු ශේෂයෙන් 2015 දෙසැම්බර් 31 වන විට රු.6,335,091 ක් හෙවත් සියයට 33 ක් පමණක් අයකරගෙන තිබුණි.

(ආ) 2015 වර්ෂය සඳහා බිල් කිරීම රු.15,267,795 ක් වූ අතර එයින් අයකරගෙන තිබුණේ රු.5,885,511 ක් හෙවත් සියයට 39 ක් පමණි.

2.2.3 **දැන්වීම් පුවරු ගාස්තු**

සභා බල ප්‍රදේශය තුළ සවි කර තිබූ දැන්වීම් පුවරු සඳහා රු.173,250 ක් වූ ගාස්තු අයකර නොතිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

3:1 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

(අ) සේවකයින් 69 දෙනෙකුගෙන් අය විය යුතු රු.115,378 ක් වූ සේවක ණය අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2013 වර්ෂයේදී පුස්තකාල පොත් සමීක්ෂණයේදී නිරීක්ෂණය වී තිබූ නගර සභා ප්‍රධාන පුස්තකාලයේ හා මරදාන කියවීම් ශාලාවේ පිළිවෙලින් රු.39,046 ක් වටිනා පොත් 327 කද, රු.2,069 ක් වටිනා පොත් 23 ක ඌනතාවයන් අදාල නිලධාරීන්ගෙන් අයකරගෙන නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට එකතු කළ අගය මත බදු ගිණුමේ ශේෂය වූ රු.1,636,979 ක් සහ ජාතිය ගොඩනැගීමේ බදු ශේෂය වූ රු.96,004 ක් විගණිත දිනය වූ 2016 මැයි 31 දින වන විටත් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

3.2 **මානව සම්පත් කළමනාකරණය**

2015 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත පරිදි විය.

| | අනුමත | තථ්‍ය | පුරප්පාඩු |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 03 | 02 | 01 |
| ද්විතීය | 38 | 33 | 05 |
| තෘතීය | 02 | 02 | -- |
| කණිෂ්ඨ | 135 | 118 | 17 |
| | 178 | 155 | 23 |

සභාවේ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 23 ක් පැවතියද කාර්යයන් සිදු වී තිබුණු බැවින් තථ්‍ය කාර්ය මණ්ඩලය, අනුමත කාර්ය මණ්ඩලය බවට පත් කර ගැනීමට විධිවිධාන යොදා නොතිබුණි.

3:3 **<u>කොන්ත්‍රාත් පාලනය</u>**

(අ) හලවගොඩ පාර පළුදු මකා තාර දමා අළුත්වැඩියා කිරිමේ ව්‍යාපෘතිය රු.408,130 ක අනුමත ඇස්තමේන්තුවක් මත රු.582,030 ක වියදම් දරා ඉටු කර තිබුණි. වැඩ නිම් වාර්තාව අනුව අතිරේකව සිදු කළ රු.173,900 ක වැඩ සම්බන්ධයෙන් අතුරු ඇස්තමේන්තුවක් සකසා අනුමැතිය ලබාගෙන නොතිබූ අතර ද්‍රව්‍ය අවශ්‍යතා ලැයිස්තුවක්ද පිළියෙල කර නොතිබුණි.

(ආ) පරණ පාර තාර දමා අළුත්වැඩියා කිරීම සඳහා රු.188,596 ක ඇස්තමේන්තුවක් සභාව විසින් අනුමත කර තිබූ අතර සම්මත ආකාරයට සපයන ලද ABC මිශ්‍රණය සපයා ගොනු කර මිණුම් ගැනීමෙන් අනතුරුව මාර්ග තලයේ අතුරා ටොන් 08 කට නොඅඩු මාර්ග තලනයකින් ජලය එක් කරමින් තැලීම සඳහා ABC කියුබ් 3.5 ක් ඇස්තමේන්තු කර තිබුණද භාණ්ඩ නිකුත් කිරීමේ සටහන් අනුව මෙම මාර්ගයට ABC එක් කර තිබුණේ කියුබ් 1.87 ක් පමණි. එසේම කළුගල් 1 ½" කියුබ් 04 ක් වෙනුවට යෙදා තිබුණේ කියුබ් 0.93 ක් පමණි.

4. **<u>පද්ධති හා පාලන</u>**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැයකරණය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය

(ඉ) කොන්ත්‍රාත් පාලනය